# මැලිබන් දරුවන්ගේ සිත් යහගුණයෙන් පෝෂණය කරමින් සිඟිති සාදය පොත එළි දක්වයි

වසර 60කට අධික කලක් පුරා රසික හදවත් තුළ නොසැලෙන විශ්වාසයක් රැන්දූ මැලිබන් බිස්කට් සමාගම ශ්‍රී ලංකාවේ විශ්වසනීයතම සහ ජනප්‍රියතම බිස්කට් වෙළඳ නාමය ලෙසින් කීර්තිමත් සලකුණක් සනිටුහන් කර ඇත. එම අභිමානවත් ගමන් මග තුළ මැලිබන් සමාගම දරුවන්ගේ දෛනික පෝෂණය සහ යහගුණයට ප්‍රමුඛත්වය ලබා දෙමින් නිෂ්පාදන බිහි කිරීම සුවිශේෂයෙන් සඳහන් කළ හැකිය.

මැලිබන් බිස්කට් සමාගම සිදු කරන අඛණ්ඩ සමාජ සත්කාරයන්හි දිගුවක් ලෙසින් ඉකුත් දා "සිඟිති සාදය" නමින් වටිනා ග්‍රන්ථයක් එළි දැක්වීමට සමාගම සමත් විය. "දඟ තරමටම රසයි" යන ගෝල්ඩ් මාරිවලට අයත් සොඳුරු තේමා පාඨය අනුව යමින් රචිත මෙම ග්‍රන්ථය ප්‍රවීණ ළමා කතා කතුවරියක හා ජනප්‍රිය චිත්‍ර ශිල්පිනියක වන සිබිල් වෙත්තසිංහ මහත්මිය විසින් නිර්මාණය කර ඇත. යහපත් පුරුදු සහ සාරධර්ම වල අගය නිර්මාණශීලීව පුංචි සිත්වලට කාවැදෙන අයුරින් රචනා කර ඇති මෙම ග්‍රන්ථය පොඩිත්තන්ට සමාජය පිළිබඳ සරල දැනුමක් ලබා ගැනීමට උපකාරී වන අතරම කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ වටිනාකම සහ පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම මනාව පෙන්වා දෙයි.

මෙම ග්‍රන්ථ එළිදැක්වීම පිළිබඳ මැලිබන් සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ කුමුදිකා ප්‍රනාන්දු මහත්මිය සිය අදහස් පළ කළේ මෙලෙසිනි. "දැනුම යනු ලෝකය වෙනස් කිරීම සඳහා දරුවන්ට දිය හැකි වටිනාම දායාදයයි. දරුවන්ට යහගුණ සහ සාරධර්ම ඉගැන්විය හැකි නිර්මාණශීලී කාර්යයන් කෙරෙහි මැලිබන් සමාගම නිරතුරුව අවධානය යොමු කරනවා. එමඟින් අපගේ මතු පරපුර ස්වයං විනයක් සහිත යහගුණයෙන් සවිබල ගැන්වූ සම්පතක් බවට පත්වනු නොඅනුමානයි. වසර ගණනක් පුරා අප දරුවන් නිරෝගීව සහ ක්‍රියාශීලීව සිටීමේ වැදගත්කම අවධාරණය කරන පියවර රැසක පුරෝගාමීන් ලෙස කටයුතු කර තිබෙනවා. මෑතකදී මැලිබන් සමාගම එළි දැක් වූ MALIBAN ABC LEARNIES හි තිබෙන අද්විතීය රස ගුණ සහ ආකර්ෂණීය හැඩය නිසාම එය දරුවන් අතර ජනප්‍රියතම නිෂ්පාදනයක් බවට පත්ව තිබෙනවා. දරුවන්ගේ අනාගතය ආලෝකමත් කිරීමේ හොඳම මංපෙතක් ලෙස දැනුම බෙදා දීම අඛණ්ඩව ඉදිරියට රැගෙන යාමේ පියවරක් ලෙස සිඟිති සාදය පොත එළි දක්වීම හඳුන්වන්න පුළුවන්. වසර 60කටත් අධික කලක් පුරා දරුවන්ගේ පෝෂණය සහ යහගුණය ගොඩනැංවීම සඳහා කැප වීමේ සමාගම සතු ප්‍රතිපත්ති "සිඟිති සාදය" වැනි වටිනා ග්‍රන්ථයක් එළිදැක්වීමෙන් සනාථ කිරීමට හැකි වී තිබෙනවා. "සිඟිති සාදය", සතුට විනෝදය සමඟින් සාරධර්මවල හරය කියාදෙන ග්‍රන්ථයක්."

අසම සම උසස් ප්‍රමිතිය, නවතම රසයන්ගෙන් මෙන්ම තාක්ෂණික දියුණුවෙන් ද නිරතුරුව සවිබල ගැන්වෙන මැලිබන් දේශීය බිස්කට් ලොව ප්‍රමුඛයා බවට පත්ව ඇත. පාරිභෝගිකයන් රසයෙන් පිනවූ ෆලූඩා මාරි වැනි නවතම නිෂ්පාදන ඒ සඳහා වූ කදිම උදාහරණයන් ලෙස දැක්විය හැකිය. මීට අමතරව විටමින් අඩංගු ගෝල්ඩ් මාරි වැනි රසික හදවත් ආකර්ෂණය කළ නිෂ්පාදන පාරිභෝගිකයන්ට රසය පමණක් නොව සිරුරට අවශ්‍ය පෝෂණ ගුණයද ලබා දෙයි.

**2018** වසරේදී **LMD** සඟරාව අඛණ්ඩ දෙවන වරටත් මැලිබන් සමාගම ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනාදරයට පාත්‍ර වූ වෙළඳ නාමය ලෙසින් නම් කළ අතර "ප්‍රමිතිය අපේ ආගමයි ('Quality is our Religion')" යන තේමා පාඨය මුල් කර ගත් මැලිබන් රසය සිය තත්ත්වයෙන් උසස් රසය වෙනුවෙන් ජාත්‍යන්තර සම්භාවනාවට පාත්‍රවීමට ද සමත්ව ඇත.

**Caption -** මැලිබන් සමූහයේ කළමනාකාර අධ්‍යක්ෂ, කුමුදිකා ප්‍රනාන්දු මහත්මිය (වම් පස) කලා කීර්ති සිබිල් වෙත්තසිංහ මහත්මිය (දකුණු පස)